# වික්‍රමසිංහ මහතා අවබෝධ කළ දේ හා නො කළ දේ

මාර්ටින් වික්‍රමසිංහ මහතා සිංහල ලකුණ සෙවීමට මහත් උත්සාහයක් ගෙන ඇති බවට සැකයක් නැත. එහෙත් අවාසනාවකට ඒ මහතා එසේ කෙළේ බටහිර දෘෂ්ටිකෝණයකින් ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා මෙන් ම ඒ මහතාගේ අනුගාමිකයන් බොහෝ දෙනකු තේරුම් නො ගත් හා නො ගන්නා කරුණ මෙය ය. ඇතැම් විට වික්‍රමසිංහ මහතා ද සිතන්නට ඇත්තේ අනෙක් උගතුන් මෙන් ම තමන් ද ඊනියා විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් ප්‍රශ්න දෙස බලන බව ය. එහෙත් ඊනියා විද්‍යාත්මක දෘෂ්ටි කෝණය යනු අන් කිසිවක් නො ව බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දෘෂ්ටි කෝණය බව ඒ මහතා නො දත්තේ ය.

ජාතක කතාව පිළිබඳ ව මාර්ටින් වික්‍රමසිංහ මහතා දැක්වූයේ ඒ මහතා සමස්තයක් ලෙස ගත් කල බුදුදහම හා සිංහල සංස්කෘතිය ගැන දැක්වූ ආකල්ප ම ය. ඒ මහතාට අනුව සිංහල සංස්කෘතිය භාරතීය සංස්කෘතිය මෙන් නො ව සරල යථාර්ථවාදී වූවක් විය. සිංහල සංස්කෘතිය ඒ අර්ථයෙන් ගත් කල භාරතීය සංස්කෘතියට වඩා බටහිර සංස්කෘතියට සමීප විය. වික්‍රමසිංහ මහතාගේ බුදුදහම ද ඕල්කට් බෞද්ධයන්ගේ බුදු දහම මෙන් ම යථාර්ථවාදී හා බටහිර විද්‍යාත්මක වූවක් විය. අද සිටින ඇතැම් ඕල්කට් බෞද්ධයන්ට මෙන් ම ඒ මහතාට ද සිංහල සංස්කෘතියෙහි බටහිර සංස්කෘතික ලකෂණ දැකීමේ අශ්‍යතාවක් විය.

මාර්ටින් වික්‍රමසිංහ මහතාට බටහිර විද්‍යාවේ ඊනියා විද්‍යාත්මකභාවය පිළිබඳ කිසිදු ප්‍රශ්නයක් නො වී ය. ඔහුට බටහිර විද්‍යාව සත්‍ය විය. ඔහු කෙතරම් බටහිර විද්‍යාවෙන් වශී වී සිටියේ ද යතහොත් බටහිර මානව විද්‍යාව (Anthropology)- ලංකා විශ්ව විද්‍යාලයෙහි එකල නූගැන්වීම පිළිබඳව මැසිවිලි කීවේ ය. එසේ නූගැන්වීම පිළිබඳ ව ලංකා විශ්ව විද්‍යාලයෙහි පළමු උපකුලපති වූ අයිවෝර් ජෙනිංග්ස් මහතා විවේචනය කෙළේ ය. අද ලංකාවේ විශ්ව විද්‍යාලවල මානව විද්‍යාව උගැන්වෙයි. එයින් සිංහලයන්ට සිදු වී ඇති හානිය දැක ගැනීමට වික්‍රමසිංහ මහතා ජීවත් නො වීම සමහර විට එතුමාගේ වාසනාවක් විය හැකි ය. මෙයින් කියැවෙන්නේ එකල මානව විද්‍යාව නූගැන්වීමෙන් ලංකා විශ්ව විද්‍යාලය නිවැරැදි වූ බවක් හෝ සිංහලයන්ට පකෂපාතී වූ බවක් හෝ නො වෙයි. මානවවිද්‍යාව ඊනියා ශාස්ත්‍රීය දැනුම් පද්ධතියක් ලෙස එකල ඇතැමුන් අතර පිළිගැනීමක් නො වී ය. වික්‍රමසිංහ මහතා එහි දී දුර දැකීමක් ඇති ව ක්‍රියා කළා නො ව හුදු අනුකාරකයකු ලෙස බටහිර මානව විද්‍යාව සරණ ගියේ ය. එක්ස් කණ්ඩායමේ සාමාජිකයන් හා වෙනත් අය අද බටහිර මනෝවිශ්ලේෂණය (Psychoanalysis) සරණ යන්නේත් එලෙස ම අනුකාරකයන් ලෙස ය.

බටහිර ඊනියා විද්‍යාව හා බටහිර න්‍යාය හා තර්කණය අගය කළ මාර්ටින් වික්‍රමසිංහ මහතාට සිංහල සංස්කෘතියෙහි ද ඊනියා විද්‍යාත්මක ලකෂණ ඇති බව පෙන්වීමට අවශ්‍ය විය. අද බුදු දහම විද්‍යාත්මක යැයි පෙන්වීමට උත්සාහ කරන්නන්ගේ වෑයම ද ඒ "නිවැරදි වූ ද, සත්‍ය වූ ද" බටහිර විද්‍යාව බුදු දහම සමග එකඟවන බව පෙන්වීම ය. එමගින් ඔවුන් සතුටක් ලබන්නේ "නිවැරදි හා සත්‍ය" බටහිර විද්‍යාව සමග බුදු දහම එකඟ වනු දැකීමෙන් ය. ඔවුන්ගේ සම්මතය බටහිර දැනුම ය. ඒ සම්මතය සමග බුදු දහම එකඟ වන බව පෙන්වීමෙන් ඔවුහු බුදු දහමට ද ගෞරවයක් අත්පත් කර දෙන්නේ යැයි සිතති. බටහිර විද්‍යාව නොමැතිවාට බුදු දහමට දෙපයින් නැගී සිටීමට ශක්තියක් ඇති බව මොවුහු නො දනිති.

මාර්ටින් වික්‍රමසිංහ මහතා ජාතක කතා බටහිර යථාර්ථවාදී කෙටි කතා සමග සංසන්දනය කිරමේ අසාර්ථක ව්‍යායාමයක නිරත විය. බටහිර යථාර්ථවාදී කෙටි කතාවෙහි ඇති ලකෂණ ජාතක කතාවෙහි ද ඇතැයි ඒ මහතා විශ්වාස කෙළේ ය. කතා වස්තුව, ඒ ගොතා ඇති අන්දම, චරිත විකාශනය, සරල බව ආදිය අතින් ජාතක කතාව බටහිර කෙටි කතාවට සමීප යැයි පෙන්වා දීමට වික්‍රමසිංහ මහතා උත්සාහ කෙළේ ය. එහෙත් ඒ මහතා එහි දී මුළුමනින් ම වැරදි බව පහසුවෙන් ම පෙන්වා දිය හැකි ය. එහෙත් එපමණකින් ඒ මහතා වරදක් කර ඇති බව සමාජයෙහි පිළිගැනෙන්නේ යැයි නොසිතිය යුතු ය. ඊනියා විද්‍යාත්මක බණ ඇසීම සඳහා පැයකට රුපියල් පහළොස් දහසකට වඩා ගෙවීමට සූදානම් ඕල්කට් බෞද්ධයන් සමාජයෙහි සිටින තාක් එසේ නො වේ.

© Prof. Nalin De Silva

ජාතක කතා ලියා ඇත්තේ සමාජයේ යහපත උදෙසා යැයි අපි කීවෙමු. ඒ යහපත සිංහල බෞද්ධයන් යහපත යැයි හැදිනගත් දේ මිස බටහිර ක්‍රිස්තියානි සමාජය හැදිනගත් දෙයක් නො වේ. සිංහල බෞද්ධ සමාජයෙහි යහපත ලෙස දැක්කේ අවසානයේ දී නිවන් අවබෝධයට තුඩු දෙන පිළිවෙත් අනුගමනය කිරම ය. මෙරට වාචික මෙන් ම ලිඛිත සහිත්‍යය සකස් වූයේ එවැනි යහමගක මිනිසුන් යැවීමට ය. නිවන අරමුණු කරමින්, නිවන මධ්‍යයෙහි තබා ගනිමින් ජනතාවගේ පහන් සංවේගය සඳහා සාහිත්‍යය හා කලා ශිල්ප නිර්මාණය විණි. මෙහි දී විශේෂයෙන් ම සඳහන් කළ යුත්තක් වන්නේ සිංහල සමාජයෙහි හුදු සාහිත්‍ය කෘති හෝ කලා කෘති කිසි දිනෙක බිහි නො වුණු බව ය.

කලා කෘති ලෙස වෙන ම කෘතීන් බිහි වීම ඇරඹුණේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සමග ය. කලාව විද්‍යාවෙන් ද, විද්‍යාව ඉතිහාසයෙන් ද ආදී වශයෙන් විෂය මතුපිටින් හෝ වෙන් කිරමක් ඉන් පෙර නො තිබිණි. මතුපිටින් හෝ විෂය අනෙක් විෂයන්ගෙන් වෙන් කිරම ඇරඹුණේ දකුණු යුරෝපයේ පහළොස්වැනි සියවසේ දී ය. සිංහලයෝ එසේ විෂය වෙන් නො කළ හ. ජාතක පොත වත්මන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ඇසින් නම් සාහිත්‍ය කෘතියක් නො වේ. එහි සමාජයට යහමග පෙන්වා දීමක් ද සිදු වෙයි. එහි පණිවුඩයක් ද වෙයි.

අද මෙරට සිටින ඇතැම් පඬිවරුන් සාහිත්‍යකරුවා සමාජශෝධකයකු නො විය යුතු බවට බෙරිහන් දෙනු අප අසා ඇත. දැක ඇත. ඒ අදහස මේ ප්‍රබුද්ධයන් තම අන්තර්ඥානයෙන් නිර්මාණය කරගත්තක් නො වේ. ඒ හුදෙක් බටහිර අදහසක් පුනරුච්චාරණය කිරමකි. මාර්ටින් වික්‍රමසිංහ මහතා කිසි දිනෙක තමා සමාජශෝධකයකු ලෙස නො සිතී ය. එහෙත් ජාතක කතා කියුවෝ හා ලියුවෝ තමන් සමාජශෝධකයන් ද වූ බව කිසිවිටෙකත් අමතක නො කළ හ. සමාජශෝධනය හා සාහිත්‍යය සිංහල බෞද්ධ සමාජයෙහි එකිනෙකින් වෙන් වූ දැ නො විණි.

සාහිත්‍යයෙන් පණිවුඩ නො දිය යුතු බව සාහිත්‍යකරුවන්ගේ හා ප්‍රබුද්ධයන්ගේ අදහස ය. එය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පට්ටා ගැසූ අදහසක් බව අමුතුවෙන් කිව යුතු නො වේ. සාහිත්‍යයෙන් පමණක් නො ව කිසි ම කලා කෘතියකින් සමාජයට පණිවුඩයක් නො දිය යුතු යැයි බටහිර ලිබරල්වාදීහු අදහති. එහෙත් ඇතැම් මාක්ස්වාදීන්ට, විශේෂයෙන් ම ට්‍රොට්ස්කිවාදීන් නො වන්නන්ට, කලා කෘතියකින් සමාජයට පණිවුඩයක් දීමේ වරදක් නැත. බටහිර ඊනියා යථාර්ථවාදී සාහිත්‍යය හා සෝවියට් සමාජසත්තා යථාර්ථවාදී සාහිත්‍යය අතර ඇති ප්‍රධාන වෙනසක් නම් මේ පණිවුඩය පිළිබඳව ඔවුනොවුන්ගේ ආකල්පවල වෙනස ය. සමජසන්තා යථාර්ථවාදයෙහි සමාජවාදී පණිවුඩ දීම හා සමාජවාදය ප්‍රචාරය කිරම ද සිදු වෙයි.

මාර්ටින් වික්‍රමසිංහ මහතා තම ජීවිතයේ සැඳෑ භාගයෙහි මෙරට සමාජසත්තා යථාර්ථවාදී ලේඛකයන් සමග කිට්ටුවෙන් වැඩ කළත්, සෝවියට් දේශය ගැන පොත පත ලියුවත් කෙදිනක වත් සමාජසත්තා යථාර්ථවාදියෙක් නො වී ය. ඒ මහතා මැදි වයසේ ලියන ලද කෘතිවල අද අපෝහකය ලෙස හැඳින්වෙන න්‍යාය ගැන යම් යම් දේ ලියා ඇති මුත් ඒ මාක්ස් වාදය මෙරට ප්‍රචලිත කිරම සඳහා ලියූ දැ නො වී ය. අනෙක් අතට ඒ මහතාට අපෝහකය පිළිබඳ වැටහීමක් නො තිබුණු බව ද පැහැදිලි ය. මාක්ස්වාදීන් විසින් අපෝහක භෞතිකවාදය (Dialectical materialism)- යනුවෙන් හැඳින්වෙන්න ඒ මහතාට ද්වන්ද්වාත්මක භෞතිකවාදය විය. අපෝහකය යන්නට ද්වන්ද්වාත්මක යන වචනය යොදා ගැනීමෙන් ම කියැවෙන්නේ ඒ පිළිබඳව එතුමාට වූ නොදැනුවත්කම ය. වික්‍රමසිංහ මහතා වරද්දා ගත්තේ දර්ශනයෙහි එවැනි වචන තනා ගැනීමේ දී පමණක් නො වේ. බටහිර විද්‍යාව සම්බන්ධයෙන් ද ඒ මහතාට නිවැරදි වැටහීමක් නො විණි.

අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදය පිළිබඳව ඒ මහතාට ගණිතමය දැනුමක් කිසිසේත් ම නො තිබුණු බව සාමාන්‍ය පෙළ ශිෂ්‍යයකුට වුව ද වැටහෙන කරුණකි. සාපේක්ෂතාවාදය පිළිබඳ ව එතුමාට කිසි ම දිනෙක මුල් කෘති කියවා වටහා ගැනීමට තරම් ගණිතය පිළිබඳ දැනුමක් නො වී ය. එතුමා බොහෝ විට ගණිතඥයන් දුටුවේ කොඳු කඩන්නාක් මෙන් තර්ක කරන පිරිසක් ලෙස ය. තමාගේ අන්තර්ඥානය ගැන බොහෝ දේ ලියා ඇති ඒ මහතාට ගණිතයෙහි ඇති රසය හා අන්තර්ඥානය ගැන අවබෝධයක් නො වී ය. බටහිර ගණිතයේ කොඳු කඩන තර්කයක් නැත. එහෙත් බටහිර ගණිතයෙහි දී නිරවුල් ව, නිශ්චිත ව හා ඇරිස්ටෝටලීය තර්කයට ගැලපෙන පරිදි කල්පනා කිරමට පුහුණුවක් ලැබෙයි. එහෙත් ඒ සියල්ල තිබුණ ද, හොඳ අන්තර්ඥානයක් නැත්තකුට හොඳ ගණිතඥයකු විය නොහැකි ය.

© Prof. Nalin De Silva

අන්තර්ඥානය ඇත්තේ ඇරිස්ටෝටලීය තර්කයෙන් බාහිර වීම නිසා ඇතැමකුට ඉහත සඳහන් ප්‍රකාශයෙහි පරස්පරයක් පෙනී ගිය හැකි ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා සාපේක්ෂතාවාදය ගැන කියවා ඇත්තේ බර්ට්‍රන්ඩ් රසල් පඬිවරයා ගණිතඥයන් නො වන අයට ඒ පිළිබඳ දැනගැනීමට ලියා ඇති පොත පතින් බව වික්‍රමසිංහ මහතා ඒ සම්බන්ධයෙන් ලියා ඇති ලිපි ලේඛනවලින් පැහැදිලි වෙයි. එහෙත් අවාසනාවකට රසල් පඬිවරයා ඒ ගැන එලෙස ලියා ඇති දේ ද වික්‍රමසිංහ මහතාට තේර නැත. සාපේක්ෂතාවාදයෙහි මාර්ටින් වික්‍රමසිංහ මහතාට වඩාත් ම ප්‍රියතම වී ඇත්තේ සිද්ධි (Events)- ගැන ප්‍රකාශ කර ඇති කරුණු ය. ඒ පිළිබඳ සිංහලෙන් ලිවීම සඳහා වික්‍රමසිංහ මහතා භවනමාත්‍රා යනුවෙන් පාරිභාෂික ශබ්දයක් නිර්මාණය කර ඇත. ද්වන්ද්වාත්මක යන්නෙන් මෙන් ම මෙයින් ද පෙන්නුම් කරන්නේ ඒ මහතාට සිද්ධි පිළිබඳ වැටහීමක් නො තිබූ බව ය. එහෙත් මේ සියලු දුර්වලතා මැද වික්‍රමසිංහ මහතා මෙරට උගත් සමාජය විසින් පිළිගනු ලැබුණේ හා ලබන්නේ වරද්ද වරද්දා හෝ දර්ශනයෙහි හා විද්‍යාවෙහි බටහිර ක්‍රිස්තියානි නූතනත්ව අදහස් සිංහලෙන් කියා දීමට ඒ මහතා දැරූ උත්සාහයට වඩා බටහිර සාහිත්‍යය සිංහලෙන් ලිවීම නිසා ය. වික්‍රමසිංහ මහතා බටහිර අදහස්වලින් යථාර්ථවාදී සාහිත්‍යය පිළිබඳ ඇති කරගත් අවබෝධය නම් නිවැරදි විය. ඒ නිසා ම ඒ මහතාගෙන් මෙරටට වඩාත් ම හානිය සිද්ධ වූයේ ඒ ක්ෂේත්‍රයෙහි ය.

බටහිර නව කතාව හා කෙටි කතාව එකල වර්ධනය වී තිබූ ආකාරයෙන් යථාර්ථවාදී විය. එමෙන් ම වියුක්ත විය. වික්‍රමසිංහ මහතා වියුක්ත යන වචනය යොදා නොගත්ත ද ඒ මහතාට ඉන් කියැවෙන්න පිළිබඳ ව ඉතා ම ඉහළ අවබෝධයක් තිබුණු බව පැහැදිලි ය. අද පුවත්පත්වලට ඊනියා පශ්චාත්නූතනවාදී විචාර ගැන ලියන පඬිවරුන්ට වඩා සාහිත්‍යයෙහි (බටහිර විද්‍යාවෙහි හා ගණිතයෙහි නො ව) සංයුක්ත හා වියුක්තය පිළිබඳ ඉතා උසස් අබබෝධයක් වික්‍රමසිංහ මහතාට විය. එහෙත් ඒ මහතා ඒ වචන යොදාගෙන නොමැති බව ද මෙහි දී සඳහන් කළ යුතු ය. කෙසේ වෙතත් ඒ මහතා අවබෝධ නො කළ කරුබක් විය. ඒ ජාතක කතාවල චරිත සංයුක්ත බව ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva